**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2021**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල කෙටුම්පත් වාර්ෂික වාර්තා ද සමග ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.2 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම.**

2003 ජූනි 02 දිනැති අංක පිඑඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසානයේ සිට දින 60ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපත් සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන 2023 අගෝස්තු 31 වන දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2. 1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත, සහ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | (i)සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගණනය කිරීමේදී 2006 ජනවාරි සිට 2015 ජූලි දක්වා කාලය තුළ සේවකයින්ට ගෙවා ඇති ජීවන වියදම් දීමනා සංස්ථාව විසින් සලකා බලා නොතිබුණි. එමෙන්ම, සංස්ථාව විසින් කරන ලද ගණනය කිරීම් අනුව | අභ්‍යන්තර විගණකවරයා විසින් කම්කරු දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල්වරයා සමඟ සාකච්ඡාව පවත්වන ලදී. | සංස්ථාව අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිවෙළින් රු. මිලියන 349.79ක් සහ රු. මිලියන 174.89ක් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් දායක මුදලේ හිඟ මුදල් සහ එහි අධිභාරය ලෙස සංස්ථාවට ගෙවීමට සිදු විය.<br>කෙසේ වුවද, දායක මුදල් හා අධිභාර ලෙස රු. මිලියන 524.68 ක් 2023 අගෝස්තු 31 වන විටත් සංස්ථාව විසින් ගෙවා තිබුණි. | | |
| | | (ii) 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට රු. මිලියන 421.78 ක දායකත්වයක් සහ රු. මිලියන 147.39 ක අධිභාරයක් ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට නොගෙවූ මුළු දායක මුදල රු. මිලියන 607.62 ක් වූ අතර, 2023 අගෝස්තු 31 වන විටත් එය ගෙවා නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට වාර්තා කරන ලද ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල 2022 දෙසැම්බර් 06 දිනැති කම්කරු කොමසාරිස් සමඟ සාකච්ඡාවට ගෙන එන ලද ගෙවීම් සැලැස්ම සිදුවෙමින් පවතී. | සේවක අර්ථසාධක අරමුදල් පනතේ නියමයන් ප්‍රකාරව නියමිත වේලාවට දායක මුදල් ප්‍රේෂණය කිරීමට සහ අධිභාර ගෙවීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරන ලද 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2020/48 දරන ඇණවුම් සමග චෙක්පත් අභ්‍යන්තර චක්‍රලේඛයේ 08 වැනි ඡේදය. | ඇණවුම් සමග චෙක්පත් මගින් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 30 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද අත්තිකාරම් උපලේඛනය අනුව, රු. මිලියන 518.81 ක අත්තිකාරම් දින 30 ක කාලයක් නිරවුල් කර නොතිබුණි. ඉන් රු. මිලියන 11.24ක් සහ රු. මිලියන 224.84ක් 2021 දෙසැම්බර් 31 වන විට පිළිවෙලින් වර්ෂ එක සිට | ඇණවුම් සමග චෙක්පත් අඩු කිරීමට සහ පවතින ශේෂය මාසය තුළ පියවීමට පියවර ගෙන ඇත. මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා විකල්ප වැඩපිළිවෙළක් හඳුන්වා දෙමින් 2023 පෙබරවාරි 02 දිනැති අංක 2023/07 දරන සාමාන්‍යාධිකාරී චක්‍රලේඛය නිකුත් කරන ලදී. | අත්තිකාරම් නියමිත කාලසීමාව තුළ පියවිය යුතු අතර ඒවා පියවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | පහ දක්වා සහ වර්ෂ පහකට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. තවද, උපලේඛනය අනුව ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම්වල බැර ශේෂය රු. මිලියන 206.54 ක් වූ අතර බැර ශේෂයන් සඳහා හේතු විගණනයේ දී අනාවරණය නොවීය. | | |
| (ඇ) | 1979 දෙසැම්බර් 20 දිනැති අංක 122/1979 දරන විශේෂ මුදල් අත්තිකාරම් පිළිබඳ අභ්‍යන්තර චක්‍රලේඛයේ 4 වැනි ඡේදය | සේවා හෝ භාණ්ඩ සැපයීම සඳහා විශේෂ මුදල් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 14 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වුවද, වර්ෂ 05 ට වැඩි විශේෂ මුදල් අත්තිකාරම් ලෙස ලබා දුන් රු. මිලියන 11.31ක මුදල් අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි. | මාසයක් ඇතුළත හිඟ මුදල් අඩු කිරීමට පියවර ගන්නා ලදී. | චක්‍රලේඛයට අනුව විශේෂ මුදල් අත්තිකාරම් අදාළ කාල සීමාව තුළ පියවීමට කටයුතු කළ යුතු බව. |

## 2.2 කාර්යසාධනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 3(2) වගන්තියට අනුව, 2008 මාර්තු 28 දිනැති අංක 1543 ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර තිබුණු සංස්ථාවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

(i) ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු සහ අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම (ii) උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම (iii) දේපල සංවර්ධන කටයුතු භාර ගැනීම (iv) සකස්කරන ලද කොන්ක්‍රීට් මිශ්‍රණ, සවිගැන් වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යාබල කොන්ක්‍රීට් නිෂ්පාදන නිෂ්පාදනය සහ අලෙවිකිරීම (v) ඉංජිනේරු ව්‍යාපෘති/ ව්‍යාපාර සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නිෂ්පාදනය, විකිණීම, ආනයනය සහ අපනයනය (vi) ඉංජිනේරු සහ තාක්ෂණික පිරිස් පුහුණු කිරීම (vii) ඉහත අරමුණු සඳහා භාවිතා කරනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය, ක්‍රම සහ ශිල්පීය ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.

**2.2.1** ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය සහ යාන්ත්‍රික හා විදුලි අංශය සහ මාර්ග සහ පාලම් අංශය තුළ සිදු කරන ලද ස්ථිර වැඩබිම් සහ වැඩපල සම්බන්ධයෙන් කාර්යසාධනයේ සාරාංශය පහත දැක්වේ.

| අනු අංකය | විස්තරය | ආදායම | | | වියදම | | ශුද්ධ ලාභය / (අලාභය) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2020** රු.මි. | **2021** රු.මි. | වෙනස % | **2020** රු.මි. | **2021** රු.මි. | **2020** රු.මි. | **2021** රු.මි. | වෙනස % |
| 01 | පෙරසවි අංගනය - ඒකල | 105.02 | 113.87 | 8.43 | 196.92 | 191.98 | (91.90) | (78.11) | 15.01 |
| 02 | පෙරසවි අංගනය - රත්මලාන | 50.35 | 66.54 | 32.15 | 90.21 | 97.26 | (39.86) | (30.72) | 22.93 |
| 03 | දංකොටුව වඩු හා මිශ්‍ර අංගනය | 9.94 | 7.91 | 20.42 | 32.87 | 44.33 | (22.93) | (36.42) | (58.83) |
| 04 | දෙමටගොඩ කොන්ක්‍රීට් සිල්පර අංගනය | - | 82.33 | - | 16.78 | 88.33 | (16.78) | (6.00) | 64.24 |
| 05 | වැලිකන්ද පෙරසවි අංගනය | 0.02 | 1.27 | 6250 | 4.7 | 3.11 | (4.68) | (1.84) | 60.68 |
| 06 | ඇලුමිනියම් වැඩපල රත්මලාන - | 19.88 | 56.55 | 184.46 | 39.18 | 75.93 | (19.30) | (19.38) | (0.41) |
| 07 | පැලියගොඩ ප්‍රධාන වැඩබිම | 21.43 | 53.16 | 148.06 | 56.07 | 49.77 | (34.64) | 3.39 | 109.79 |
| 08 | පැලියගොඩ මෙහෙයුම් වැඩබිම | 7.12 | 22.40 | 214.61 | 52.83 | 61.77 | (45.71) | (39.37) | 13.87 |
| 09 | රත්මලාන වැඩබිම | 6.84 | 28.80 | 321.05 | 26.16 | 52.44 | (19.32) | (23.64) | (22.36) |
| 10 | ප්‍රවාහන සහ සැපයුම් අංශය | 12.90 | 14.49 | 12.32 | 39.91 | 37.31 | (27.01) | (22.82) | 15.51 |
| 11 | ගිනි නිවන සේවා ගොඩනැගිලි වැඩබිම | 5.21 | 23.60 | 352.98 | 11.57 | 22.39 | (6.36) | 1.21 | 119.02 |
| | **එකතුව** | **238.71** | **470.92** | **97.28** | **567.2** | **724.62** | **(328.49)** | **(253.70)** | **22.77** |

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථිර වැඩබිම් සහ වැඩපලවල කාර්යසාධනය පිළිබඳ ආදායම් සහ වියදම් විස්තර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 253.70 ක සමස්ථ පාඩුවක් සිදු වී තිබූ බවත් එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 19.82 ක වර්ධනයක් බවත් නිරීක්ෂණය විය. තවද, වැඩබිම් දෙකක් පමණක් ලාභ ලබා තිබූ | මාසික කාර්යසාධනය සමීපව අධීක්ෂණය තුළින් සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම මගින් තත්ත්වය අවම කිරීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කරන ලදි. | පාඩු අවම කර ගැනීමටත් නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතු බව. |

අතර අනෙක් ඒවා පාඩු මත මෙහෙයවනු ලැබ තිබුණි.

## 2.3 සංස්ථාවේ මුදල් ප්‍රවාහය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.66,716,881 ක සෘණ ශේෂයක් විය. එබැවින් ඉදිරියේදී ව්‍යාපෘති මගින් ප්‍රමාණවත් ලාභයක් උපයා ගැනීමට සංස්ථාව අපොහොසත් වුවහොත් මූල්‍ය තත්ත්වය තවදුරටත් දුර්වල වනු ඇත. | - | කළමනාකරණයේ සමීපව අධීක්ෂණයක් ඇතිව මුදල් කළමනාකරණය සඳහා නිසි කාරක ප්‍රාග්ධන කළමනාකරණයක් ක්‍රියාත්මක කළ යුතු බව. |

## 2. 4 ජාතික යන්ත්‍රෝපකරණ ආයතන (NEMO) අංශයේ මෙහෙයුම් කටයුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | - | ව්‍යාපෘතිවල නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය, අදාළත්වය සහ ව්‍යාපෘති වියදම් සඳහා අධිකාරිය, තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

## 2.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රාජ්‍ය බැංකුවෙන් ලබාගත් රු. මිලියන 2,100 ක ණය පියවා නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලී රු. මිලියන 569 කි. | කළමනාකාරිත්වය පැහැදිලිවම ණය සහ එහි සේවා පිරිවැය දැරිය නොහැකි බව මෙම සීමිත ක්‍රියාකාරකම් තත්ත්වය මත අවබෝධ කරගෙන ඇති අතර බැංකු ණය ඇතුළු දිගුකාලීන වගකීම් ද ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරමින් සිටී. | කළමනාකරණය විසින් ලාභදායිත්වය සම්පූර්ණ කර ගැනීම සඳහා පාඩු අවම කර ගැනීමටත් ලාභ ඉපැයීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ 8.4 වගන්තිය ප්‍රකාරව ජංගම ගිණුම් 07ක රු. 378,234ක් වූ ශේෂයන් නිශ්ක්‍රියව පැවති අතර, 2021 දෙසැම්බර් 31 දිනට අක්‍රීය බැංකු ගිණුම් අඛණ්ඩව | අදාළ නිවැරදි කිරීම් සඳහා කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

පවත්වාගෙන යාමේ අවශ්‍යතාව සාධාරණීකරණය කිරීම පිළිබඳව අර්ධ වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර බැංකු ගිණුම් වසා දැමීමට කළමනාකාරීත්වය අවධානය යොමු කර නොතිබුණි.

## 2. 6 හඳුනා ගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වසරේ සිට 2020 දක්වා කාලය තුළ ආදායම් බදු, එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ භාණ්ඩ හා සේවා බදු පිළිවෙලින් රු.10,562,151, රු.1,158,194,068, රු.97,745,394, රු.65,211,052 සහ රු.2,120,553 ක් නියමිත වේලාවට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. 130,431,594 ක අධිභාරයක් පනවා තිබුණි. | වාර්තාවේ සඳහන් බදු වර්ගවලට අදාළව පැහැර හරින ලද බදු සහ අදාළ අධිභාර කළමනාකරණය විසින් හඳුනාගෙන ඇත. | සංස්ථාව විසින් නියාමන අවශ්‍යතා සපුරාලිය යුතු බව. |

## 2.7 නිශ්ක්‍රිය වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව සතු ඇලුමිනියම් බාර් සහ සිවිලිම් තහඩු තොගයක් තක්සේරුකර නොමැති නමුත් 2017 වසරේ සිට ප්‍රයෝජනයට නොගෙන NEMO හි ප්‍රධාන ගබඩාවල පවතී. | මෙම කාරණය පැහැදිලි කර නිරාකරණය කර ප්‍රගතිය කළමනාකාරිත්වයට සහ විගණකවරුන්ට වාර්තා කරන ලෙස NEMO සහ SEC අදාළ නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබේ. | මෙම වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව. |

## 2.8 අනෙකුත් ආයතන වෙත නිදහස් කරන ලද සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති චක්‍රලේඛ අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ 8.3.9 හි දක්වා ඇති උපදෙස් වලට පටහැනිව සංස්ථාවේ සේවකයින් හතලිස්හය දෙනෙකු (46) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, රජයේ කර්මාන්තශාලාව, සංස්කෘතික අරමුදල, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙත මුදා හැර තිබුණි. කෙසේ වුවද, සංස්ථාව විසින් ගෙවන ලද රු. 55,254,044 ක වැටුප් හා අතිකාල ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | ප්‍රධාන ගිණුම් නිලධාරීන් සහ ආයතන ප්‍රධානීන් හරහා ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කඩිනම් කර තිබේ. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතු අතර අදාළ රාජ්‍ය ආයතනවලින් වැටුප් ප්‍රතිපූරණය කර ගත යුතු බව. |

**2.9 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හතක් පුරප්පාඩු විය. | ඉහළ මට්ටමේ නිලධාරීන් විසින් අවශ්‍ය පරිදි වැඩ බැලීම් සහ රාජකාරී ආවරණ විධිවිධාන සකස් කරන ලදි. | අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම් නිසි අනුමැතියක් සහිතව බඳවා ගැනීමට හෝ අවශ්‍ය පරිදි සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතු බව. |
| **(ආ)** | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.2 වගන්තියට අනුව පත්වීමක් සිදු කළ යුත්තේ අනුමත සේවක සංඛ්‍යාවේ නිශ්චිත සේවක තනතුරු සංඛ්‍යාවක් සඳහා පමණක් වන නමුත් ඊට පටහැනිව අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරු 27ක් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට අතිරික්ත සේවකයන් 345ක් පත් කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනමින් සහ තාවකාලික පදනමින් සේවා අවශ්‍යතා සහ ව්‍යාපෘති පදනම මත බඳවා ගැනීම් සිදු කරන ලදී. | අනුමත සේවක සංඛ්‍යාව තුළ බඳවා ගැනීම් සිදුකළ යුතු බව. |
| **(ඇ)** | 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. කෙසේ වුවද, එම විධිවිධාන නොසලකා හරිමින්, සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් අනුමත නොකළ තනතුරු 12 ක් සඳහා සේවකයින් 14 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනමින් සහ තාවකාලික පදනමින් සේවා අවශ්‍යතා සහ ව්‍යාපෘති පදනම මත බඳවා ගැනීම් සිදු කරන ලදී. | බඳවා ගැනීම් සම්බන්ධයෙන් කළමනාකාරීත්වය නීති රීති වලට අනුකූල විය යුතු බව. |